# ඇත් ගොව්වාගේ ඓතිහාසික කාර්යභාර්ය හා එහි වර්තමාන ප්‍රවණතා

**නලින් විශ්වනාත් ***

ගොඩබිම ජීවත් වන විශාලතම සත්ත්වයා සමඟ සිය ජීවන වෘත්තිය තෝරාගත් දුර්ලභ චරිතයක් ලෙස ඇත් ගොව්වා හඳුනාගත හැකි ය. අනුරාධපුර යුගයේ දී මේ අපූර්ව මිනිසා "යහන් ගොවු" යනුවෙන් ද මධ්‍යතන යුගයේ දී "ඇත්තල" ලෙස ද හඳුන්වා තිබේ. වර්තමාන පොදු ජන ව්‍යවහාරයේ දී ඇත් ගොව්වා හඳුන්වනුයේ "අලිබාසුන්නැහේ" යනුවෙනි. මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කරනුයේ ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ දේශපාලන, ආර්ථික සමාජ හා සංස්කෘතික කාර්ය සාධනයේ දී ආත් ගොව්වාගේ මැදිහත් වීමේ ස්වරූපය හඳුනා ගැනීමට ය.

පර්යේෂණයේ දී සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරෙන් හා දැනට එම වෘත්තියේ නියැලී සිටින ඇත්ගොව් වෘත්තිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුළින් තොරතුරු රැස්කර තිබේ. ඓතිහාසික යුගයේ දේශපාලනික කටයුතුවලදී මංගල, යුධ, වධක යන ත්‍රිවිධ කාර්ය සඳහා හස්තියා උපයෝගී කරගෙන ඇති අතර එම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඇත්ගොව් වෘත්තිකයිනගේ කැපවීම අතවශ්‍ය කරුණක් විය. එසේ ම විවිධ සංවර්ධන කටයුතුවලදී ද බර වැඩ සිදුකිරීම සඳහා හස්තීන් මෙහෙය වීම එකල වඩාත් වැදගත් කාර්යක් විය. වැව් තැනීම, ගොඩනැගිලි ඉදිකිරීම, බඩු භාණ්ඩ ප්‍රවාහනය, මංමාවත් ඉදිකිරීම ආදී කටයුතුවලදී හස්තියා යොදාගෙන ඇත. එසේම විවිධ මුහුණුවර ගත් සංස්කෘතික ක්‍රියාකරකම්වලදී හස්තියා විවිධ ආකාරයෙන් යොදාගත් බවට මූලාශ්‍රගත තොරතුරු පවතී. විශේෂයෙන් පෙරහැර, වප්මගුල් උත්සව, ආගමික උත්සව වැනි අවස්ථාවලදී හස්තියා යොදා ගැනිණි. මෙසේ ඓතිහාසික යුගයේ විවිධ කටයුතු සඳහා හස්තීන් යොදාගත් ආකාරය හඳුනාගත හැකිය. ඒ ඒ යුගයේදී ඇත් ගොව්වෝ විවිධ ආකාරයෙන් දායකත්වය ලබාදීම පිළිබඳ ව මෙහිදී සාකච්ඡා කිරීමට නියමිත ය.

එසේම වර්තමාන ඇත් ගොව්වන් සිය වෘත්තියෙහි නියැලීම සම්බන්ධව නූතන ප්‍රවණතා හඳුනා ගැනීමත් මෙම අධ්‍යයනයේ අභිමථාර්තයකි. නූතන සමාජය තුළ සිදු වූ බොහෝ වෙනස්කම් මධ්‍යයේ හා යන්ත්‍ර සූත්‍ර කරලියට පැමිණි අවස්ථවකදී ඇත් ගොව් භූමිකාවේ වෙනස්කම් හා ඔවුන්ගේ පාරම්පරික දැනුම හා සමාජය තුළ ඔවුන්ට හිමි තැන වැනි කරුණු කෙරෙහි මෙම අධ්‍යයනයේදී තොරතුරු විමර්ශනය කිරීමට අපේක්ෂා කෙරේ.

**මුඛ්‍ය පද - ඇත් ගොව්වා, හස්තියා, ආගමික උත්සව, පාරම්පරික දැනුම**

*** පර්යේෂණ නිලධාරි, මධ්‍යම සංස්කෘතික අරමුදල.**